රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
# Department of State Accounts

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | SA/FR/Policy/Guidelines | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2026.02.19 |

**රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 01/2026**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියලුම දිස්ත්‍රික් ලේකම්වරු

**සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම ආදායම් සහ වියදම්වල ප්‍රමාණාත්මක විචලතා පිළිබඳ වාර්තා කිරීම**

මූල්‍ය විනය ශක්තිමත් කිරීම, විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ ඵලදායී මූල්‍ය විශ්ලේෂණයට පහසුකම් සැලසීම සඳහා, සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම ආදායම් සහ වියදම්වල වාර්ෂික වෙනස්කම් ක්‍රමානුකූලව සමාලෝචනය කිරීම අවශ්‍ය බව හඳුනාගෙන ඇත.

ඒ අනුව, සියලුම වාර්තාකරණ ආයතන විසින් එක් එක් ආදායම් ශීර්ෂය යටතේ එකතු කරන ලද ආදායම සහ අදාළ මූල්‍ය වර්ෂය තුළ එක් එක් වැඩසටහන, ව්‍යාපෘතිය සහ වැය විෂයය යටතේ දරන ලද වියදම් පෙර මූල්‍ය වර්ෂයේ සංඛ්‍යා සමඟ සංසන්දනය කර වාර්තා කළ යුතු වේ.

ආදායමේ හෝ වියදමේ වැඩිවීම හෝ අඩුවීම සියයට විසිපහක් (25%) ඉක්මවන විට, අදාළ ගණන්දීමේ නිලධාරියා විසින් පහත සඳහන් කරුණු තහවුරු කළ යුතුය.

(අ) එම විචලනය පැහැදිලිව හඳුනාගෙන ප්‍රමාණනය කර තිබීම සහ

(ආ) විචලනය සඳහා ප්‍රමාණවත් සහ සාධාරණීකරණය කළ හැකි හේතු සැපයීම හා ඒ සඳහා පැහැදිලි කිරීම් ලබා දීම. (උදා: ප්‍රතිපත්තිමය තීරණ, නව මුලපිරීම් හඳුන්වාදීම, ව්‍යාපෘති සම්පූර්ණ කිරීම හෝ අත්හිටුවීම, මිල ඉහළ යාම, ඉතිරිවීම්, ප්‍රසම්පාදන ප්‍රමාදයන් හෝ වෙනත් ඕනෑම වැදගත් සාධක)

ඉහත තොරතුරු ඇමුණුම I ලෙස මේ සමඟ අමුණා ඇති නියමිත ආකෘතියෙන් සැපයිය යුතු අතර ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී විසින් නිවැරදි හා සම්පූර්ණ බවට නිසි ලෙස සහතික කළ යුතුය.

ඉහත සඳහන් සැසඳුම් වාර්තාව ගිණුම් අදාළ වන වර්ෂයට පසු එළඹෙන මූල්‍ය වර්ෂයේ පෙබරවාරි 28 වන දින හෝ ඊට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට - fernando.wah@sad.treasury.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය හරහා ඉදිරිපත් කළ යුතුය.

කාලෝචිත හා ඵලදායී මූල්‍ය වාර්තාකරණය සහතික කිරීම සඳහා මෙම උපදෙස් දැඩි ලෙස පිළිපැදීමට කටයුතු කරන ලෙස සියලු ගිණුම්කරණ ඒකකවලට දැනුම් දෙනු ලැබේ.

මෙම මාර්ගෝපදේශය 2025 මූල්‍ය වර්ෂය සහ ඉන් පසුව එළඹෙන මූල්‍ය වර්ෂ සඳහා ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම සම්බන්ධයෙන් කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - මූල්‍ය වාර්තාකරණ සහ ප්‍රතිපත්ති (දුරකථන: 2484898) හෝ අධ්‍යක්ෂ (මූල්‍ය වාර්තාකරණ) (දුරකථන: 2484733) හෝ අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති) (දුරකථන: 2484890) අමතා අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාගත හැකිය.

ඩබ්ලිව්.ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්

මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව. பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General-Tel.: +94 11 2484500/600 Ext.: 1149
Director General - Tel.: +94 11 2484728
Fax +94 11 2484869
Fax +94 11 2473856
Website www.sad.gov.lk
e-mail dgsa@sad.treasury.gov.lk

ඇමුණුම I

# ආදායම් සහ වියදම්වල ප්‍රමාණාත්මක විචලනයන් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම:

...............................................................................

මූල්‍ය වර්ෂය : ....................

පෙර මූල්‍ය වර්ෂය : ....................

(අ)

**1.** වියදම් සංසන්දනය පිළිබඳ සාරාංශය

| වැය විස්තරය | වියදම | | විචලනය | |
|---|---|---|---|---|
| | පෙර මූල්‍ය වර්ෂය (රු.) | ප්‍රවර්තන මූල්‍ය වර්ෂය (රු.) | (රු.) | % (+/–) |
| | | | | |
| | | | | |
| | | | | |

**2.** ආදායම් සංසන්දනය පිළිබඳ සාරාංශය

| ආදායම් කේතය | ආදායම | | විචලනය | |
|---|---|---|---|---|
| | පෙර මූල්‍ය වර්ෂය (රු.) | ප්‍රවර්තන මූල්‍ය වර්ෂය (රු.) | (රු.) | % (+/–) |
| | | | | |
| | | | | |
| | | | | |

ආ. **25%** ඉක්මවන විචලනයන් පිළිබඳ විස්තර

ආදායම් සහ වියදම්වල වැඩිවීම හෝ අඩුවීම **25%** ඉක්මවන සියලුම අවස්ථා සඳහා මෙම කොටස අනිවාර්ය වේ.

**1.** වියදම්

| වැය විස්තරය | විචලනය % | විචලනයේ ස්වභාවය (වැඩිවීම / අඩුවීම) | විචලනයට හේතු | එකවරක් පමණක් සිදුවේද නැතහොත් පුනරාවර්තනය වේද? |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

**2.** ආදායම

| ආදායම් ශීර්ෂය | විචලනය % | විචලනයේ ස්වභාවය (වැඩිවීම / අඩුවීම) | විචලනයට හේතු |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

ඈ. සහතික කිරීම

ඉහත තොරතුරු සත්‍ය, නිවැරදි සහ සම්පූර්ණ වන අතර, ආදායම් සහ / හෝ වියදම් විචලනයන් **25%** ඉක්මවීම සඳහා සපයා ඇති හේතු වලංගු සහ ප්‍රමාණවත් ලෙස සාධාරණ වේ.

........................................ ......................                                        ......................

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරී                                        දිනය